**සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය - 2019**

**----------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**-----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

--------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් අධිකාරිය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් අළුත්වැඩියා කිරීම සඳහා දරා තිබුණු රු.1,215,299 ක වියදම් වත්කම් අත්පත් කරගැනීම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | වත්කමේ ජීව කාලය ඉදිරියට පවත්වාගෙන යාමටත්, ඒ තුළින් ආර්ථික ප්‍රතිලාභ වසර කිහිපයක් ලබා ගැනීමට හැකියාව පැවතීම නිසා මෙම ගිණුම්ගත කිරීම සිදු කර ඇත. | පුනරාවර්තන ස්භාවයේ වියදම් බැවින් වර්ෂයේ වියදමක් ලෙස සැලකිය යුතුය. |
| (ආ) | අධිකාරියේ අරමුදලින් මිලට ගෙන බාහිර ආයතනයක් වෙත දී තිබුණු වටිනාකම රු. 2,092,540 ක් වූ ශබ්ද තරංග | 2020 මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | නිවැරදිව වත්කම් ගිණුම් ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | උපකරණ මූල්‍ය ප්‍රකාශන තුළ වත්කම් ලෙස දක්වා තිබුණි. | | |
| (ඇ) | ශුද්ධ අගය රු.1,747,535 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු අස්පෘශ්‍ය වත්කම් හා එම වත්කම් ක්‍රමක්ෂය කිරීම සම්බන්ධයෙන් අනුගමනය කර තිබුණු ගිණුම් ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | ගිණුම් ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කල යුතුය. |

### 1.5.3 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ (6)(ඇ) වගන්තිය | පනතේ ප්‍රධාන කාර්යයන් වලින් බැහැරව එකතු වන අපද්‍රව්‍ය පරීක්ෂා කර තහවුරු කර ගැනීමකින් තොරව සාගරයට බැහැර කර තිබූ අතර අන්තරාකාරී ද්‍රව්‍ය වන සායනික අපද්‍රව්‍ය දිගු නල මගින් සාගරයට සෘජුව බැහැර කර තිබුණි. | 2020 වර්ෂයේ සට මෙම ක්‍රම වේදයට අනුගත වී ඇත. | පනතට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ (6)(ඉ) වගන්තිය | දැවි තෙල් අපද්‍රව්‍ය කාණ්ඩය යටතේ ලියාපදිංචි වන සියලුම සේවා සපයන්නන් විසින් මූලික තැන්පතු ලෙස රු.300,000 ක් තැබිය යුතු වුවද ඉන් බැහැරව දැවි තෙල් සඳහා රු.150,000 බැගින්ද කසල හා මල අපද්‍රව්‍ය සඳහා රු. 20,000 බැඟින්ද තැන්පත් කර තිබුණි. | | |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2013 ජුනි 28 දිනැති අංක 37/1816 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය | මෝදර හා වැල්ලවත්ත ස්ථානවලින් අපද්‍රව්‍ය සාගරයට බැහැර කිරීමට අදාල ගැසට් පත්‍රයේ සඳහන් දෙවන වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මේ සඳහා ක්‍රියාමාර්ග ගතයුතු රාජ්‍ය ආයතන වලින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැත . | මෙම ප්‍රදේශවල දූෂණය ඉතාමත්ම අධිකව පවතින බැවින් එම දූෂණයන් අවම කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | i. මුදල්රෙගුලාසි 396 (ඇ) | නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ මාස 06 ක් ඉක්මවූ වටිනාකම රු.321,394 ක් වූ චෙක්පත් 15 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 396 පරිදි කටයුතු කරඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| | ii. මුදල් රෙගුලාසි 110(ඇ) | අනතුරට ලක්වී තිබුණු වාහන 4 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | දැනටමත් විමර්ශන කමිටුවක් පත්කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| | iii. මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර නොතිබුණි | මේ වන විට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,952,703 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 27,476,884 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 24,524,180 ක පිරිහීමක් නිරීක්ෂණය විය. වැටුප්, වේතන, සේවක ප්‍රතිලාභ හා අනෙකුත් පුනරාවර්ථන වියදම් රු. 27,506,018 ක ඉහලයාමක් මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී ප්‍රමිතියෙන් තොරව කොන්ක්‍රීට් බංකු 10 ස්ථාපිත කිරිමට රු.131,075 ක් වැයකර තිබූ අතර එම බංකු ප්‍රමිතියෙන් තොරව ඉදිකිරිම හේතුවෙන් විනශ වී තිබුණි. | විමර්ශන කමිටුවක් පත්කර විමර්ශන සිදු කෙරෙමින් පවති. | මුදල් ගෙවිමට ප්‍රථම ප්‍රමිතියට අනුව නිම කර ඇති බවට තහවුරු කර ගත යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුහුදු සීමාවේ සිට මීටර් 300 ක් ගොඩබිම දක්වා වූ සීමාවේ මුහුදට අපද්‍රව්‍ය බැහැරවන ආකාරයෙන් තනා ඇති වැසිකිළි හා අපද්‍රව්‍ය යලි ප්‍රතිචක්‍රීයකරණය නොකර මුහුදට දැමීම සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන දැනුවත් කිරීමටත්, ප්‍රතිචක්‍රීයකරණය නොකර මුහුදට දමන අපද්‍රව්‍ය හේතුවෙන් සංචාරක කර් මාන්තයට විශේෂ බලපෑමක් විය හැකි බැවින් එම ගැටළුව සම්බන්ධව සංචාරක සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් සමඟ සාකච්ඡා කොට ඉදිරියේදී ක්‍රියාකළ හැකි ආකාරය පිළිබඳව වාර්.තාවක් සකස් කිරීමටත් තීරණය කළද එය ඉටුකර නොතිබුණි. | පළාත් පාලන ආයතන දැනුවත් කිරීමටත් කටයුතු කරනු ලැබේ. | අදාල වාර්තාව කඩිනමින් ලබාගෙන ඉදිරි ක්‍රියාමාර්ග ගැනිමට කටයුතු කල යුතුය. |

**3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ගාල්ල කාර්.යාලයේ රු.2,197,998 ක් වැයකර ස්ථාපිත කරන ලද විද්‍යාගාරය සඳහා පුහුණු කරන ලද නිලධාරියා එම කාර්.යාලයට අනුයුක්ත නොකර ප්‍රධාන | සමාන සුදුසුකම් ඇති සමුද්‍ර පරිසර නිලධාරියෙකු අනුයුක්ත කර ඇත. | අරමුණ ඉටු කර ගැනිම කෙරෙහි වැඩි අවධානයක් යොමුකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කාර්.යාලයේ රඳවාගෙන තිබුණි. මේ හේතුව නිසා විද්‍යාගාරය ස්ථාපිත කිරීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීමට නොහැකි වී තිබුණි. | | |
| (ආ) | වටිනාකම රු.5,700,000 ක්වූ පරමාණුක අවශෝධනය වර්.ණාවලී ද්විත්ව මානයක් වර්.ෂ තුනකට වඩා වැඩි කාලයක් කිසිදු උපයෝජනයකින් තොරව විද්‍යාගාරය තුල නිෂ්ක්‍රීයව පැවති අතර එම උපකරණය භාවිතයට ගත නොහැකිවීම හේතුවෙන් අළුත්වැඩියා කිරීම සඳහා රු.1,212,299 ක මුදලකට නියෝජිතායතනයක් සමඟ එකඟතාවයකට පැමිණි තිබුණි. | මෙම කටයුතු ඉක්මනින් නිම කිරිමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. | වත්කම් උපරිම උපයෝජනයකින් යුක්තව භාවිතා කල යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විධායක කළමනාකරණ මට්ටමේ තනතුරු 05 ක් වර්ෂ දෙකකට වැඩි කාලයක සිට පුරප්පාඩු වී තිබූ අතර ඉන් එක් තනතුරකට 2018 වර්ෂයේ කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි. | මේ දක්වා බඳවා ගැනීම් සිදුකර නැත. | ස්ථිර කාර්යමණ්ඩල පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කළ යුතුය |
| (ආ) | බඳවා ගැනීමේ පටිපාටියෙන් බැහැරව මූලික සුදුසුකම් සම්පූර් ණ කර නොමැති අයදුම්කරුවකු මුල්‍ය නිලධාරි තනතුර සඳහා බඳවාගෙන තිබුණි. | විමර්ශන කමිටුවක් පත් කර විමර්ශන සිදු කෙරෙමින් පවති. | මූලික සුදුසුකම් සම්පූර්ණ තරන ලද නිලධාරියෙකු බඳවා ගැනිම සිදු කල යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනුමත කාර්ය මණ්ඩලය අනුව අභ්‍යන්තර විගණන අංශයට, අභ්‍යන්තර විගණකට අමතරව විගණන නිලධාරීන් දෙදෙනෙකු අනුයුක්ත කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මෙතෙක් අනුමැතිය ලැබී නොමැත. | අධිකාරිය සතුව ප්‍රාදේශීය කාර්යාල 09 ක් ඇති බැවින් අභ්‍යන්තර විගණන අංශයේ කාර්යමණ්ඩලය වැඩි කළ යුතුය. |

### 4.2 විගණන කමිටු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්වුවද එම කමිටුවේදී ගන්නා ලද තීරණයන් ක්‍රියාත්මක කිරීම මන්දගාමී අයුරින් සිදුවී තිබුණි. | අදහස් දක්වා නැත. | විගණන කමිටුව විසින් ගනු ලබන තීරණයන් කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය. |

### 4.3 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මාදම්පිටිය පිරිපහදු පොම්පාගාරය වෙත පිටස්තර ආයතනවල මළ සහ අපජලය රැගෙන එනු ලබන බවුසර්.වලින් ලබාගන්නා නියැදි අතුරින් කිහිපයක් පමණක් එම ස්ථානයේ ස්ථාපිත කර ඇති විද්‍යාගාරය තුළ පරීක්ෂණයන්ට ලක්වන අතර එහිදී පරීක්ෂා කරනුයේ බෝහෝවිට අප ජලයේ පීඑච් (PH)අගය පමණක් බව නිරීක්ෂණය විය. ප්‍රමාණවත් කාර්.ය මණ්ඩලයක් නොමැතිව එක් පරීක්ෂණ නිලධාරිණියක් පමණක් සේවය කරනු ලබන මෙම විද්‍යාගාරය මගින් කරනු ලබන පරීක්ෂණ ප්‍රතිඵල රහිත | කොළඹ නගර සභාවෙන් අවශ්‍ය සහයෝගය නොලැබුණු බැවින් එය ක්‍රියාත්මක නොවුණි. | නියමිත පරිදි දූර්වල අවස්ථා හඳුනාගෙන ඊට අදාල ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක්‍රියාවක්වන අතර පොම්පාගාරයට බැමට පෙර නියමිත ප්‍රමිතියෙන් තොර අප ජලය සහිත බවුසර්. හඳුනා ගැනීමට නොහැකි වීම හේතුවෙන් සිදුවන සමුද්‍ර දූෂණය වැලැක්වීමට අපහසු වී තිබුණි. | | |
| (ආ) | ධීවර කර්මාන්තය ආශ්‍රිතව සිදුවන සමුද්‍රිය පරිසරය දූෂණය වන ක්‍රමවේද හඳුනාගැනීම තුළින් එය අවම කිරීම සඳහා ජාතික උපායමාර්ග හා ක්‍රියාකාරී සැලැස්ම අධිකාරිය විසින් කෙටුම්පත් කර තිබුණි.<br>එම කෙටුම්පත් සැලැස්ම ක්‍රියාකාරී මට්ටමට ගෙන ඒම සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර එය වඩාත් ඵලදායී ලෙස පිළියෙල කිරීම සඳහා රැස්වීමක් පැවැත්වීමට කටයුතු කර තිබුණද එම සැලැස්මේ කටයුතු නිශ්චය කර ක්‍රියාත්මක කිරිමට කටයුතු කර නොතිබුණි. | ධීවර වරායන්හී අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම සකස් කරමින් පවතී. | නියමිත පරිදි දූර්වල අවස්ථා හඳුනාගෙන ඊට අදාල ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | දිවයින වටා ධීවර වරායන් 25 ක් පවතින අතර ඒ මගින් විශාල ලෙස අපද්‍රව්‍ය හා අප ජලය සමුද්‍රයට එක් වේ. අප ජලය පිරිපහදු පද්ධති නොමැති වීමත් ධීවර පරිශ්‍රයන් තුළ ධීවර බෝට්ටු අළුත්වැඩියාවන් හා තීන්ත ආලේපන කටයුතුද අත් හරින ලද ධීවර ආම්පන්න ආදිය මගින්ද අධික ලෙස සමුද්‍රය දූෂණයට ලක්වී තිබුණි. | අමාත්‍යාංශය ලේකම් මගින් අවශ්‍ය කටයුතු සිදුකර ගැනීමට කටයුතු යොදා ඇත. | දූෂණය අවම කිරීම සඳහා කඩිනමින් කටයුතු කළ යුතු බව. |

**4.4 තිරසාර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම සඳහා දර්ශක 05 ක් හඳුනාගෙන තිබූ අතර එය එක්සත් ජාතීන්ගේ අවධානය සඳහා යොමුකර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඒ සඳහා ලැබිය යුතු උපදෙස් අධිකාරිය වෙත ලැබී නොතිබුණි. | අවශ්‍ය සැලසුම් සකස් කරමින් පවතී. | තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම සඳහා සියළුම රාජ්‍ය ආයතන කටයුතු කිරීම අනිවාර්ය බැවින් ඒ සඳහා කඩිනමින් පියවර ගත යුතුය. |